# ස්වාධීන සේවක සංගමය එ. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

RTIC Appeal (ලේඛනගත කාර්ය පටිපාටිය)/ 1939/2020 (2020.07.13 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති**: මහින්ද ගම්මම්පිල

**කොමිෂන් සභා සමාජික**: ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සමාජික**: විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල්** : වසන්ත හපුආරච්චි

**අභියාචක** : ස්වාධීන සේවක සංගමය

**නොතීසි ලත් පාර්ශවය** : නම් කළ නිලධරයා, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

මෙය ලේඛනගත කාර්යපටිපාටිය යටතේ විභාග කරන ලදි.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.08.01 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.08.16 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.08.30 |

| | |
|---|---|
| | |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.09.30 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:

අභියාචක විසින් තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කරන ලද 2019.08.01 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි. එනම්**:**

> *01. ධීවර වරාය නීතිගත සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටිය දිනය වන 2018.04.26 දින සිට අප සංස්ථාවට බඳවා ගත් තනතුරු නාමයන් සහිතව එක් එක් තනතුරු සඳහා කොපමණ සංඛ්‍යාවක් ස්ථිර ද කොන්ත්‍රාත් ද යන්න ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. (අභ්‍යන්තර ...... **[**පැහැදිලි නැත**]** සමග )*

ඉන්පසුව**,** තොරතුරු නිලධරයා 2019.08.16 දිනැති ප්‍රතිචාර යක් දක්වමින් (වෙනත් දෑ අතර ) පහත පරිදි දක්වා තිබේ. එනම්:

> *මගේ අංකය : CFHC /HR/RTI/2019/28*
> *දිනය : 2019.08.16*
> *වෙත : 01. සභාපති - ස්වාධීන සේවක ස.ගමය*
> *පිටපත : වැ.බ. සාමාන්‍යාධිකාරි ( අභියාචනා නිළධාරි )*
> *වෙතින් : මානව සම්පත් කළමනාකාර ( තොරතුරු නිළධාරි )*
> *විෂයය : තොරතුරු දැනගැනිමේ අයදුම් පත්‍රය සම්බන්ධයෙනි.*
>
> ---------------------------------------------------------------------------

*උක්ත මැයෙන් මා විසින් ඔබ වෙත යොමු කරන ලද 2019.08.01 දිනැති ලිපිය හා බැඳේ.*
*ඒ අනුව ඔබ විසින් ඉල්ලුම් කර ඇති තොරතුරු සියල්ල අන්තර්ගතව ඇති සැකසූ ලේඛනයක් අප සන්තකයේ/භාරයේ නොපවතින බැවින් ඔබ විසින් ඉල්ලුම් කර ඇති තොරතුරු සැපයීය නොහැකි බව කාරුණිකව දැනුම් දෙමි.*

ඉහත ප්‍රතිචාරයෙන් සෑහීමට පත් නොවූ අභියාචක ඉන්පසුව නම් කළ නිලධාරියාට 2019.08.30 දිනැති අභියාචනයක් ඉදිරිපත් කර තිබේ. නම් කළ නිලධරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින්, අභියාචක විසින් 2019.09.30 දිනැතිව අභියාචනයක් මෙම කොමිසමට ගොනු කර තිබේ.

## අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, රීති අංක 19 හි ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව, මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

දෙපාර්ශයම ලිඛිත දේශන ගොනු කර නොමැත.

අභියාචක විසින් 2019.11.08 දිනැති ලිපියක් මගින් කොමිසමට දන්වා ඇත්තේ ඒ වන විටත් නම් කළ නිලධාරියා විසින් ඉල්ලා ඇති තොරතුරු සපයා දී නොමැති බවය.

පොදු අධිකාරිය විසින් මෙම කොමිසමට නිකුත් කර තිබෙන 2020.07.10 දිනැති ලිපිය මගින් (වෙනත් දෑ අතර ) දන්වා ඇත්තේ,

*අදාල ඉල්ලීමට අනුගතව සියළු කරුණු අන්තර්ගතව සැකසූ ලේඛනයක් අප සන්තකයේ නොපවතින බව 2019.08.16 දිනැති අංක CFHC/HR/RIT/2018/28 දරණ ලිපිය මගින් මානව සම්පත් කළමණාකාර ( තොරතුර්ය් නිළධාරි ) විසින් ස්වාධීන සේවක සංගමයේ සභාපති වෙත දැනුම් දී ඇත.*

> *කෙසේ වෙතත් අභියාචක විසින් යොමුකර ඇති තොරතුරු ඉල්ලීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉටු කිරීමට හැකියාවක් පවතින බව අභියාචන විභාගයේදී තීන්දු වුවහොත්, අදාළ ඉල්ලුම් කරන ලද තොරතුරු ලබා දීමට මා විසින් කටයුතු කරන බව කාරුණිකව ඔබ වෙත දැනුම් දෙමි.*

වශයෙනි.

**නියෝගය**

කොමිසම විසින් මේ අවස්ථාවේදී තොරතුරු පනතේ 31(3) වගන්ති වෙත අවධානය යොමුකොට සිටී. එනම්:

> 31(3) වගන්තිය :
> නම්කළ නිලධරයා විසින්, (1) වන උප වගන්තිය යටතේ සදහන් කර ඇති යම් අභියාචනයක් පිළිබඳ තීරණය, එම අභියාචනය ලැබී සති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර, ඒ සඳහා වූ නිශ්චිත වූ පදනම ඇතුළුව එම තීරණය සඳහා වු හේතුද දැක්විය යුතුය.

තොරතුරු පනතේ ඉහත සඳහන් වගන්තිය කඩකිරීම මත මෙම කොමිසමට තොරතුරු පනතේ 38 වගන්තිය යටතේ කටයුතු කිරීමට හැකි බව අවධාරනය කර සිටී.

තොරතුරු පනතේ 3 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව, එකී පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොදු අධිකාරියක් සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසකම සෑම පුරවැසියකුටම ති බේ. තොරතුරු පනතේ 43 වන වගන්තිය යටතේ තොරතුරු යන්නට, පහත සඳහන් ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසලකා, සටහන්, ලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල්, මත, උපදේශ මාධ්‍ය නිවේදන, චක්‍රලේඛ, නියම, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, හුවමාරු වන ලිපි, සංදේශ, නීති කෙටුම්පත්, පොත්, පිඹුරු, සිතියම්, චිත්‍ර, රූපසටහන්, රූපමය හෝ ප්‍රස්තාරමය වැඩ හෝ ඡායාරූප, සේයාපට, ක්ෂුද්‍ර සේයාපට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍ර මගින් කියවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය සහ ඒවායේ යම් පිටපත් ඇතුලත් වේ.

අභියාචක විසින් පොදු අධිකාරියට යොමු කරන ලද තොරතුරු ඉල්ලීම යටතේ ඉල්ලා ඇති තොරතුරු හෝ එකී තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති තොරතුරු

පහැදිලිවන තොරතුරු - එනම්: තොරතුරු පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව කිසියම් තොරතුරක්, පොදු අධිකාරිය සතුව පවතින්නේ නම්, මෙම නියෝගය ලැබී සති දෙකක් ඇතුළත, කොමිසම් සභාවට පිටපතක් සහිතව, ඉල්ලා සිටින එම තොරතුරු අභියාචකට ලබා දීමට කටයුතු කරන ලෙසට නියෝග කරනු ලැබේ.

තොරතුරු ඉල්ලීම අනුව ඉල්ලා ඇති තොරතුරු හෝ එකී තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති තොරතුරු පහැදිලිවන තොරතුරු - එනම්: තොරතුරු පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව කිසියම් තොරතුරක්, තොරතුරු පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති නම් හෝ තොරතුරු ලබා නොදීමට, තොරතුරු පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව හේතු තිබේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කොට, කොමිසම් සභාවට පිටපතක් සහිතව, අභියාචක වෙතට, මෙම නියෝගය ලැබී සති දෙකක් ඇතුළත, ලබා දීමට කටයුතු කරන ලෙසට නියෝග කරනු ලැබේ.

නැවත ලේඛනගත කාර්යපටිපාටිය යටතේ විභාග කිරීම සඳහා කල්තබනු ලැබේ.

මී ළඟ විභාග දිනය : 31.08.20

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.